මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

කාර්යාලය / காரியாலயம் / Office – 081-2213097
ලේකම් / செயலாளர் / Secretary – 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary – 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2213096, 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/6/6/DO/EB (2024) - II
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2024.10. 25

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සභා ලේකම්,
සියලුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් වෙත,

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ</u>
<u>I, II හා III ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2021 (2024) - II වන අදියර</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2024.09.12 දිනැති විභාග දැන්වීම හා බැඳේ.

02. ඒ අනුව, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2012.10.17 දිනැතිව අනුමත කරන ලද 'මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව' සහ 2012.11.09 දිනැතිව, 'මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව' යනුවෙන් සංශෝධිත ව්‍යවස්ථාවට අනුකූලව සංවර්ධන නිලධාරී සේවයේ I, II හා III ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2021 (2024) - II වන අදියර සඳහා අයැදුම්පත් කැඳවීම මේ වන විට සිදුකෙරෙමින් පවතී.

03. මාගේ සමාංක හා 2024.10.18 දිනැති ලිපිය මඟින් දැන්වූ පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ I, II හා III ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2021 (2024) - II වන අදියරෙහි අයැදුම්පත් කැඳවීම සඳහා භාවිතා කරන ලද ගූගල් පෝරමයේ තාක්ෂණික දෝෂයක් ඇතිවීම හේතුවෙන් ඒ සඳහා විභාග අයැදුම්කරුවන්ගේ තොරතුරු ඇතුලත් කිරීමට විෂයභාර නිලධාරීන්ට නොහැකි විය.

04. ඒ අනුව, මෙම විභාගයේ අයැදුම්පතෙහි අඩංගු තොරතුරු ඇතුළත් කිරීම සඳහා නව ගූගල් පෝරමයක් (Google Form) සකස් කර එහි දිගුව (Hyperlink) මෙම දැන්වීම සමඟම ඔබගේ ආයතනයේ නිල විද්‍යුත් තැපැල වෙත එවනු ලැබේ. **<u>(ඔබ ආයතනය යටතේ උප ආයතන පවතින්නේනම් ඔබ විසින් එම ආයතන වෙත මෙම දැන්වීම යැවිය යුතු අතර, වෙනත් බාහිර පාර්ශව වෙත යැවීම නොකළ යුතුය.)</u>** මෙම ගූගල් පෝරමය වෙත විභාග ඇයැදුම්කරුගේ අයැදුම්පත සහ උසස්කිරීමේ/අන්තර්ග්‍රණය කිරීමේ ලිපිය ඇතුලත් කිරීමට <u>අවශ්‍ය නොවන අතර</u>, පෙර පැවති ගූගල් පෝරමය වෙත තොරතුරු ඇතුලත් කරන ලද අයැදුම්කරුවන්ගේ තොරතුරු නව ගූගල් පෝරමය වෙත ඇතුලත් කිරීම අවශ්‍ය නොවන බවද කාරුණිකව දන්වමි .

05. මෙම විභාගයේ අයැදුම්පත් මාර්ගගතව ඇතුළත් කළහැකි අවසන් දිනය **<u>2024.11.14</u>** දින දක්වා දීර්ඝ කරන අතර, අපේක්ෂකයින් විසින් ප්‍රමාණවත් කාලයකට පෙර සම්පූර්ණ කරන ලද අයැදුම්පත තම පුද්ගලික ලිපිගොනුව පවත්වාගෙන යන ආයතනය වෙත භාර දිය යුතුය.

06. අයැදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම :- විභාග අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍ර ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කිරීමෙන් පසු එම අයැදුම්පත්‍රයේ ඇතුළත් තොරතුරු අදාළ ගූගල් පෝරමයේ පිරවීමෙන් අනතුරුව එක් එක් ශ්‍රේණියට අදාළ දෘඪ අයදුම්පත් ශ්‍රේණි අනුව වෙන් කර විභාග අපේක්ෂකයන්ගේ නාම ලේඛනය සමඟ 2024.11.22 දිනට පෙර මෙම කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කල යුතුය.( ලිපි කවරයේ වම් පස ඉහල කෙළවෙරෙහි "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ I,II හා III ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2021 (2024) - II වන අදියර" ලෙස සඳහන් කළ යුතුය.)

07. මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවයේ I, II හා III ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2021 (2024) - II වන අදියරෙහි අයැදුම්පත් කැඳවීමට අදාලව මාගේ සමාංක හා 2024.09.12 දිනැති ලිපියෙහි අනෙකුත් කොන්දේසි එලෙසම ක්‍රියාත්මක වේ.

08. මෙම ලිපියෙහි අඩංගු කරුණු ඔබ ආයතනයෙහි හා ඔබ ආයතනය යටතේ උප ආයතන පවතින්නේනම් එම ආයතනවල, අදාළ සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට කටයුතු කරන ලෙසත් මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට අයැදුම්කරුවන් නොමැති නම් ඒ බවද නොපමාව මා වෙත දන්වා එවන ලෙසත් කාරුණිකව දන්වමි.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.